# සිංහල අක්ෂරමාලාව

කිසියම් භාෂාවකට අයත් වචන ලිවීම සඳහා භාවිත කෙරෙන සංකේත හෙවත් වර්ණ සමූහය අක්ෂරමාලාව නම් වේ. අකාරාදිය, අක්ෂරමාලාව, අක්ෂරහෝඩිය, වර්ණමාලාව යනාදී නම් මේ සඳහා භාවිත කෙරේ. ඉංග්‍රීසි භාෂාවෙන් මෙය Alphabet නමින් හැඳින්වේ. ලෝකයේ දැනට ව්‍යවහාර හැම භාෂාවකට ම ඊට ම ආවේණික වූ නිශ්චිත අක්ෂරමාලා නොමැත. නිදසුනක් වශයෙන් ඉංග්‍රීසි - ජර්මන් - ප්‍රංශ භාෂා ලිවීම සඳහා රෝමන් අක්ෂර ද රුසියන් භාෂාව ලිවීම සඳහා සිරිලික්ස් වර්ණමාලාව ද (ඉන්දියාවේ දී) හින්දි, පාලි, සංස්කෘත ආදි භාෂා සඳහා දේවනාගරී අක්ෂරමාලාව ද භාවිත වේ. සිංහල භාෂාවේ පවත්නා සුවිශේෂත්වය නම් ඊට ම අයත් අක්ෂරමාලාවක් තිබීමයි.

අක්ෂරමාලාවෙහි ඇතුළත් අක්ෂර, අකුරු, සංකේත හෙවත් වර්ණ ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදේ.

එනම් :-

1. ස්වර (Vowels)
2. ව්‍යඤ්ජන (Consonants)

වශයෙනි.

ස්වර තනි ව ඕනෑ ම තැනක භාවිත කළ හැකි අතර ව්‍යඤ්ජන භාවිතයේ දී ස්වර උපකාරී වේ. ස්වර හැඳින්වීම සඳහා ස්වරාක්ෂර, ප්‍රාණාක්ෂර, පණකුරු යන නම් ද ව්‍යඤ්ජන හැඳින්වීම සඳහා ව්‍යඤ්ජනාක්ෂර, ගාත්‍රාක්ෂර, ගත්කුරු යන නම් ද භාවිත වේ.

සජීවී භාෂාවක වර්ණමාලාව කල්ගතවීමේ දී පරිණාමයට හෙවත් වෙනසට භාජනය වේ. කලින් කල සිදුවන භාෂාවේ වෙනස්වීම්, නව වචන භාවිතයට ඒම, ඇතැම් වචන හා අක්ෂර භාවිතයෙන් ගිලිහී යාම මෙකී පරිණාමයට හේතු වේ. ඒ අනුව සිංහල භාෂාවෙහි අක්ෂර මාලාවේ ප්‍රධාන ප්‍රභේද හයක් දැකිය හැකි ය.

එනම්,

1. සිදත් සඟරා හෝඩිය (අක්ෂර 30 යි)
2. අමිශ්‍ර (ශුද්ධ) සිංහල හෝඩිය (අක්ෂර 32 යි)
3. මිශ්‍ර සිංහල හෝඩිය (අක්ෂර 54 යි)
4. ජාතික අධ්‍යාපන ආයතන හෝඩිය (අක්ෂර 60 යි)
5. සමකාලීන සිංහල හෝඩිය (අක්ෂර 60 යි)
6. ජාත්‍යන්තර සිංහල හෝඩිය (අක්ෂර 61 යි)

යනු එම හයයි.

## සිංහල භාෂාවේ විවිධ අක්ෂරමාලා

### ▲ 1. සිදත් සඟරා හෝඩිය (අක්ෂර 30 යි)

සිංහල භාෂාවේ දැනට ඉතිරි ව ඇති පැරණි ම සිංහල ව්‍යාකරණ ග්‍රන්ථය වන්නේ දඹදෙණි යුගයෙහි දී (ක්‍රි.ව. 13 වන සියවස) පතිරජ පිරිවෙන්පති හිමියන් විසින් රචිත සිදත් සඟරාවයි. සිංහලයෙහි පැරණිතම මෙන් ම කෙටි ම හෝඩිය වන්නේ ද මෙයයි. සිදත් සඟරාවට අනුව අක්ෂර 30 කි. ඉන් 10ක් ස්වර (පණ'කුරු) වන අතර ඉතිරි 20 ව්‍යඤ්ජන (ගත'කුරු) වේ.

පණ'කුරු පසෙකි එ ද ලුහු ගුරු බෙයින් දස වේ,<br>
ගත'කුරු ද වේ විස්සෙක් වහරට යුහු සිය බසැ.

සිදත් සඟරාවේ අක්ෂරමාලාව අඩුවීමට හේතුව ශුද්ධ සිංහලයෙහි පද්‍යකරණය ඉලක්ක කර ගනිමින් මෙම වියරණ ග්‍රන්ථය සම්පාදනය කොට තිබීමයි. එහි දී පාලි, සංස්කෘත ආදී භාෂාවලින් ගත් තත්සම වචන බැහැර කොට හුදු හෙළ බසට මුල්තැන දී තිබේ. මෙහිලා සංස්කෘත භාෂාවට අයත් ප්‍රාණාක්ෂර (ඍ, ඎ, ඏ, ඐ, ඓ, ඖ) ද මාත්‍ර වෘද්ධි වීමෙන් සෑදි ඇ, ඈ යන ස්වර ද මහප්‍රාණාක්ෂර (ඛ, ඝ, ඡ, ඣ, ඨ, ඪ, ථ, ධ, ඵ, භ) ද 'ඞ, ඤ' යන වර්ගාන්තාක්‍ෂර (නාසික්‍ය අක්‍ෂර) ද 'ච' කාරය ද සංස්කෘත භාෂාවට සම්බන්ධ ඌෂ්මන් අක්ෂර දෙක (ශ, ෂ) ද විසර්ගය (ඃ) ද සංයුක්ත ව්‍යඤ්ජන සේ ගැනෙන සඤ්ඤක අක්ෂර (ඟ, ජ, ඬ, ඳ, ඹ) ද බැහැර කොට ඇත.

**සිදතෙහි පණකුරු දසය (10) නම් ඃ-** අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඒ, ඔ, ඕ

**සිදතෙහි ගතකුරු විස්ස (20) නම් ඃ-** ක, ග, ජ, ට, ඩ, ණ, ත, ද, න,

ප, බ, ම, ය, ර, ල, ව, ස, හ, ළ, අං

## ▲ 2. අමිශ්‍ර (ශුද්ධ) සිංහල හෝඩිය (අක්ෂර 32 යි)

පාලි හා සංස්කෘත බලපෑමෙන් එක් වූ අකුරු රහිත හුදු හෙළබසට ම ආවේණික වූ අක්ෂරවලින් සමන්විත හෝඩිය අමිශ්‍ර සිංහල හෝඩිය හෙවත් 'ශුද්ධ සිංහල හෝඩිය' නමින් හැඳින්වේ. 'ශුද්ධ සිංහලය', 'නුමුසු හෙළ බස' යන නම්වලින් ද මෙය ව්‍යවහාර කෙරේ. සිදත් සඟරා හෝඩියට ම 'ඇ, ඈ' යන ප්‍රාණාක්ෂර දෙක ද එකතු කොට ගැනීමෙන් අමිශ්‍ර සිංහල හෝඩිය සාද ගනු ලැබේ. පාලි හා සංස්කෘත අක්ෂරමාලාවට මෙන් ම දෙමළට ද අයත් නොවන ඇ ඈ යන ස්වරාක්‍ෂර දෙක සිංහල භාෂාවේ අනන්‍යතාව ප්‍රකට කෙරෙන අක්ෂර දෙකක් ලෙස දැක්විය හැකි ය. අමිශ්‍ර සිංහල හෝඩියට අයත් අක්ෂර සංඛ්‍යාව 32කි.

ස්වර (12 යි) ඃ- අ, ආ, ඇ, ඈ, ඉ, ඊ, උ, ඌ, එ, ඒ, ඔ, ඕ

ව්‍යඤ්ජන (20 යි) ඃ- ක, ග, ජ, ට, ඩ, ණ, ත, ද, න, ප, බ, ම,

ය, ර, ල, ව, ස, හ, ළ අං

## ▲ 3. මිශ්‍ර සිංහල හෝඩිය (අක්ෂර 54 යි)

ශුද්ධ සිංහලයට අයත් අක්ෂර මෙන් ම පාලි හා සංස්කෘත ආභාසයෙන් එක් වූ අක්ෂර ද මිශ්‍රවීමෙන් සැකැසි අක්ෂර 54 කින් සමන්විත හෝඩිය 'මිශ්‍ර සිංහල හෝඩිය' නමින් හැඳින්වේ. කුමාරතුංග මුනිදාස මහතා සිය 'ව්‍යාකරණ විවරණය' නමැති කෘතියෙහි ද තියඩෝර් ජී. පෙරේරා පියතුමා සිය 'සිංහල භාෂාව' නමැති කෘතියෙහි ද දක්වා ඇත්තේ අක්‍ෂර 54කින් යුත් මෙම මිශ්‍ර සිංහල හෝඩියයි.

ස්වර (18 යි) ඃ- අ, ආ, ඇ, ඈ, ඉ, ඊ, උ, ඌ,

ඍ, ඎ, ඏ, ඐ, එ, ඒ, ඓ, ඔ, ඕ, ඖ

ව්‍යඤ්ජන (36 යි) ඃ- ක, ඛ, ග, ඝ, ඞ, ච, ඡ, ජ, ඣ, ඤ, ට, ඨ, ඩ, ඪ, ණ,

ත, ථ, ද, ධ, න, ප, ඵ, බ, භ, ම,

ය, ර, ල, ව, ශ, ෂ, ස, හ, ළ, අං, අඃ

## ▲ 4. ජාතික අධ්‍යාපන ආයතන (N.I.E) හෝඩිය (අක්ෂර 60 යි)

මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ අංශය මගින් සම්පාදිත 'සිංහල ලේඛන රීතිය' නමැති කෘතියෙහි දක්වෙන අක්ෂර 60කින් යුත් අක්ෂර මාලාව මෙනමින් හැඳින්වේ. මෙම අක්ෂර හෝඩිය සම්පාදනය කිරීමේදී මෙරට විශ්වවිද්‍යාල විද්වතුන්, හෙළහවුලේ විද්වතුන්, ප්‍රවීණ ලේඛකයන් හා ප්‍රකට විශේෂඥයන්ගේ දයකත්වය ලැබී තිබේ. මිශ්‍ර සිංහල හෝඩියේ නොමැති සඤ්ඤක අක්ෂර 5ත්, ෆ යන අක්ෂරයත් එක් කොට අකුරු සියල්ල 60 දක්වා මෙහිදී වර්ධනය වී තිබේ. ඉංග්‍රීසි භාෂාවේ F යන අක්ෂරය සඳහා 'ෆ' යනුවෙන් නව අක්ෂරයක් ද මෙහි දී සිංහල භාෂාවට එක් විය. ඒ අනුව ෆොටෝ, කැෆේ, ෆැක්ස්, ටෙලිෆෝන් වැනි සෘණීකෘත වචන පහසුවෙන් ලිවීමට අවකාශ ලැබී තිබේ.

**ස්වර (18 යි) :-** අ, ආ, ඇ, ඈ, ඉ, ඊ, උ, ඌ, ඍ, ඎ, ඏ, ඐ, එ, ඒ, ඓ, ඔ, ඕ, ඖ

**ව්‍යඤ්ජන (42 යි) :-** අං, අඃ ක, ඛ, ග, ඝ, ඞ, ඟ, ච, ඡ, ජ, ඣ, ඤ, ඦ, ට, ඨ, ඩ, ඪ, ණ,

ඬ, ත, ථ, ද, ධ, න, ඳ, ප, ඵ, බ, භ, ම, ඹ, ය, ර, ල, ව, ශ, ෂ, ස, හ, ළ, ෆ

## ▲ 5. සමකාලීන සිංහල හෝඩිය (අක්ෂර 60 යි)

1990 දී මහාචාර්ය ජේ. බී. දිසානායක මහතා තම 'නූතන සිංහල ලේඛන ව්‍යාකරණ' නම් ග්‍රන්ථයෙහි මෙය හඳුන්වා දී තිබේ. මෙහි පවත්නා සුවිශේෂත්වය නම් මෙතෙක් පැවති 'ඏ, ඐ' යන ස්වර දෙක ඉවත් කොට ඒ වෙනුවට 'අං අඃ' වශයෙන් සංවෘත ප්‍රාණාක්ෂර දෙකක් එක් කිරීමත් 'ඦ' යන දනට භාවිතයේ විරලව පවත්නා සඤ්ඤක අක්ෂරය වෙනුවට 'ඥ' යන සංයුක්ත ව්‍යඤ්ජනය වෙන ම අකුරක් ලෙස එක් කිරීමත් ය.

**ස්වර (18 යි)** :- අ, ආ, ඇ, ඈ, ඉ, ඊ, උ, ඌ, ඍ, ඎ, එ, ඒ, ඓ, ඔ, ඕ, ඖ,

අං, අඃ

**ව්‍යඤ්ජන (42 යි)** :- ක, ඛ, ග, ඝ, ඞ, ඟ,

ච, ඡ, ජ, ඣ, ඤ, ඥ,

ට, ඨ, ඩ, ඪ, ණ, ඬ,

ත, ථ, ද, ධ, න, ඳ,

ප, ඵ, බ, භ, ම, ඹ,

ය, ර, ල, ව, ශ, ෂ, ස, හ, ළ, ෆ,

(අ)ං, (අ)ඃ

## ▲ 6. ජාත්‍යන්තර සිංහල හෝඩිය (අක්ෂර 61 යි)

ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානය (International Standards Organization) මගින් සම්මත කරන ලද සිංහල අක්ෂරමාලාව 'ජාත්‍යන්තර සිංහල හෝඩිය' නමින් හැඳින්වේ. 2000 වර්ෂය ආරම්භයෙහි ඇමෙරිකා එක්සත් ජනපදයේ The Unicode Consortium විසින් පළ කරන ලද The Unicode Standard Version 3.0 නම් කෘතියෙහි මෙම 'ජාත්‍යන්තර සිංහල හෝඩිය' හඳුන්වා දී තිබේ. ජාතික අධ්‍යාපන ආයතනය මගින් හඳුන්වා දුන් අක්ෂර 60 කින් යුතු හෝඩියට 'ඥ' යන්න ද එක්කොට අකුරු 61ක් හා පිලි 19කින් යුතු සංකේත 80 ක් මීට අයත් වේ.

අං, අඃ, අ, ආ, ඇ, ඈ, ඉ, ඊ, උ, ඌ, ඍ, ඎ, ඏ, ඐ, එ, ඒ, ඓ, ඔ, ඕ, ඖ,

ක, ඛ, ග, ඝ, ඞ, ඟ, ච, ඡ, ජ, ඣ, ඤ, ඥ, ඦ, ට, ඨ, ඩ, ඪ, ණ, ඬ,

ත, ථ, ද, ධ, න, ඳ, ප, ඵ, බ, භ, ම, ඹ, ය, ර, ල, ව, ශ, ෂ, ස, හ, ළ, ෆ

## ▲ 7. භාෂණ සිංහල හෝඩිය (අක්ෂර 40 යි)

සිංහල අක්ෂරමාලාව සම්බන්ධ ඉහත දැක්වූ ප්‍රභේද 6 ප්‍රධාන වන අතර ඊට අමතරව දැනට සිංහලයෙහි කථා ව්‍යවහාරයේ පවතින අක්ෂර එක්කොට 'භාෂණ සිංහල හෝඩිය' නමින් අක්ෂර මාලාවක් ද ඇතැමෙක් ඉදිරිපත් කොට තිබේ. ඊට අනුව දැනට ව්‍යවහාරයෙහි විරලව පවතින 'ඏ' හා 'ඐ' යන ස්වර දෙකත් 'ඓ, ඖ, ඍ, ඎ' යන ස්වර 4ත් 'ඡ' හා මූර්ධජ 'ෂ' හා 'ළ' යන්නත් 'ඥ' යන්නත් විසර්ගය (අඃ) හා බින්දුවත් (අං) ඉවත් කොට තිබේ.

**ස්වර (14 යි) :-** අ, ආ, ඇ, ඈ, ඉ, ඊ, උ, ඌ, එ, ඒ, ඔ, ඕ,

අ්, අ්

**ව්‍යඤ්ජන (26 යි) :-** ක, ග, ඞ, ඟ, ච, ජ, ඦ, ට, ඩ, ඬ, ත, ද, න, ඳ,

ප, බ, ම, ඹ, ය, ර, ල, ව, ශ, ස, හ, ෆ